# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1981 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 1.55 තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 11/79

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම සඳහා ද එම පනතේ 13 වන, 14 වන සහ 19 වන වගන්ති යටතේ කරන ලද ඇතැම් ආඥා සහ නිශ්චය කිරීම් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇති කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1\. මේ පනත 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

## I වන කොටස

### ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම

2\. (මෙහි මින් මතු මේ පනතේ මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) පෞද්ගලික භාරයක් යටතේ භාරකරුවකු විසින් වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා යම් ඉඩමක් අයිති කරගනු ලැබ ඇති අවස්ථාවක ඒ පෞද්ගලික භාරය,"; සහ

(ආ) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(5) කෘෂිකාර්මික සංවර්ධනයේ යහපත සඳහා වන්නේ යයි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් සඳහා ජනරජය විසින් යම් තැනැත්තකුට යම් කෘෂිකාර්මික ඉඩමක් බද්දට දී ඇති විටක, (4) වන උපවගන්තියේ අතුරු වගන්තියේ කුමක් සඳහන් වුව ද (1) වන උප වගන්තියේ කාර්යය සඳහා ඒ කෘෂිකාර්මික ඉඩමේ බදු ගැනුම්කරු, ඒ ඉඩමේ අයිතිකරු බවට සලකනු නොලැබිය යුතු ය.".

1—ඒ 51092—12,750 (80/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (2) (මේ උපවගන්තියේ "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයට පසු යම් දිනයක, විවාහය නිසා හෝ උරුමවීම නිසා නැතහොත් ඒ දෙකම නිසා හෝ යම් තැනැත්තකු උපරිම යට වැඩි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක අයිතිකරු බවට පත් වන අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර ඒ අනුව ඒ තැනැත්තා විසින් අදාළ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත, උපරිමයට වැඩි එම ඉඩම් විකිණීමෙන් හෝ අන්‍යාකාරයකින් පවරා දිය හැකි ය. ඒ කාලසීමාව ඇතුළත, උපරිමයට වැඩි එම ඉඩම් පවරා දීම ඒ තැනැත්තා විසින් පැහැර හරින ලද අවස්ථාවක, උපරිමයට වැඩි එම ඉඩම්, ඒ කාල සීමාව අවසානයේ දී—

(අ) කොමිෂන් සභාව වෙත සතු වූ ලෙස සැලකිය යුතු ය; තව ද

(ආ) කොමිෂන් සභාව විසින් දෙන ලද ව්‍යවස්ථාපිත බද්දක් යටතේ එම තැනැත්තා සන්තකයෙහි තබාගෙන සිටින ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියෙහි අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (4) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් උකසක්, බද්දක්, පොලී මරා බුත්තියක් නැතහොත් ජීවිත බුත්තියක් පිළිබඳව කිසියම් සිවිල් අධිකරණයක යම් නඩුවක හෝ නඩු කටයුත්තක කාර්ය සඳහා කාලාපගමන කාලසීමාව ආගණනය කිරීමේදී, (එම උකසට, බද්දට, පොලී මරා බුත්තියට නැතහොත් ජීවිත බුත්තියට විෂය කාරණාව වූ) කෘෂිකාර්මික ඉඩම, කොමිෂන් සභාව සතු වූ දිනයෙන් ආරම්භව, එම ඉඩමෙහි අයිතිකරු වෙත ගෙවිය යුතු වන්දි මුදල තීරණය කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව අත් හරිනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2අ) මේ උපවගන්තිය පනවන ලද දින සිට සහ ඉන් පසුව, මුළු ගණන අක්කර එකසිය පනහට වැඩි වූ යම් කෘෂිකාර්මික ඉඩමක් (1) වන උපවගන්තිය යටතේ පවරාදීමට, (2) වන උප වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින්, කිසිම ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුවකුට අනුමතය දෙනු නොලැබිය යුතුය:

එසේ වුව ද, මේ උපවගන්තිය පනවනු ලැබීමට පූර්වයෙන් යම් ප්‍රකාශකයකුට හෝ ප්‍රකාශකයාගේ පවුලේ යම් සාමාජිකයකුට හෝ සන්තකය භාරදෙනු ලැබ ඇත්තා වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන්, මේ පනතේ කුමක් සඳහන්ව ඇත ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (4අ) (4) වන උපවගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, (මේ උපවගන්තියේ "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයට පසු යම් දිනයක, විවාහය නිසා හෝ උරුමය නිසා හෝ ඒ දෙකම නිසා හෝ උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයේ අයිතිකරු බවට පත්ව ඒ අතිරික්තය අදාළ දිනයේ සිට අවුරුදු දෙකක කාල සීමාවක් ඇතුළත විකිණීමෙන් හෝ අන්‍යාකාරයකින් පවරාදීම, පැහැර හැර ඇති යම් තැනැත්තකු විසින්, ඒ කාලසීමාව ඉකුත් වී මාසයක් ඇතුළත, මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, ප්‍රකාශනයක් කළ යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

" (ආආ) කෘෂිකාර්මික නොවන කාර්යයන් සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව විකිණීමෙන් පවරා දීම;"; සහ

(ආ) එම උපවගන්තියේ (ඊ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

" (ඊ) (i) මේ පනත ආරම්භවීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී කෘෂිකාර්මික ඉඩම් අයිතිව සිටියා වූ, හෝ

(ii) 7 වන හෝ 8 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් මේ පනත ආරම්භවීමේ දිනයේ දී කෘෂිකාර්මික ඉඩම් අයිත්ව සිටි බව සලකනු ලැබුවා වූ ද

කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ උපරිමය පැන වූ අවස්ථාවේ දී වයස අවුරුදු දහ අටට අඩුව සිටියා වූ ද තැනැත්තකු සතු ඒ ඉඩම්, ඒ තැනැත්තා සාමාජිකයකු වූ පවුලේ ප්‍රධානයාට අයත් යයි සැලකෙන ඉඩම් ප්‍රමාණයට ඇතුලත් කිරීමේ හේතුවෙන් ඒ ඉඩම් අසන්තක කරනු ලැබුවා වූ ද යම් තැනැත්තකුට විකිණීමෙන් පවරා දීම.

පවරාදීම සිදු කරන දිනයේ දී පැවරුම්ලාභියා වයස අවුරුදු දහ අටට අඩුව සිටිය ද, මේ ඡේදය යටතේ පවරාදීමක් කළ හැකි අතර, වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකුට මේ ඡේදය යටතේ කෘෂිකාර්මික ඉඩම් පවරා දීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා, ඒ ඉඩම්වල අයිතිය පිළිබඳ කාර්ය සඳහා, මේ පනතේ "තැනැත්තා" යන්නෙහි අර්ථ කථනය යටතේ ගැනෙන ලෙස සැලකිය යුතු ය.

කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ උපරිමය නියම කරන ලද අවස්ථාවේ දී වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු විසින් අයිතිකර ගනු ලැබූ ඉඩම් මේ ඡේදය පනවන ලද දිනයේ දී 22 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පවරා දෙනු ලැබ නොමැති විටක සහ ඒ ඉඩම් සම්බන්ධයෙන් 28 වන වගන්තිය යටතේ වන්දි ගෙවනු ලැබ නොමැති විටක මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ ඉඩම් පවරා දෙනු ලැබීම වෙනුවට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් අමාත්‍යවරයා විසින් ඒ තැනැත්තාට, ඒ ඉඩම් සතු කර දෙනු ලැබිය හැකි ය. ඒ ආඥාවේ දින සිට ඒ ඉඩම්වල පරම හිමිකම ඒ තැනැත්තාට දීමට ඒ ආඥාව බල සහිත විය යුතු ය.".

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි යම් කාර්ය සඳහා අක්කර පනහට වැඩි කෘෂිකාර්මික ඉඩම් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ආආ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකු වෙත බද්දක් මගින් අන්සතු කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 27අ සහ 27ආ වගන්ති ලෙස බලපැවැත් විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ අලුතින් 27අ සහ 27ආ වගන්ති ඇතුළත් කිරීම.

" කොමිෂන් සභාව වෙත සතු කරන ලද කෘෂිකාර්මික ඉඩම් හෝ වතු ඉඩම් අමාත්‍යවරයා විසින් නියමයකින් රාජ්‍ය සංස්ථා වෙත සතු කළ හැකි ය.

27අ. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, කොමිෂන් සභාවේ යහපත සඳහා එසේ කිරීම අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින්, 22 වන, 23 වන හා 42උ යන වගන්තිවලට යටත්ව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, නියමයෙහි නිශ්චිතව සඳහන් යම් රාජ්‍ය සංස්ථාවක් වෙත, එම නියමයෙහි නිශ්චිතව සඳහන් දිනයක සිට ක්‍රියාත්මක වීමට, කොමිෂන් සභාව හා ඒ රාජ්‍ය සංස්ථාව අතර එකඟ විය හැකි, රාජ්‍ය සංස්ථාව වෙත ඒ ඉඩම සතු කිරීම සඳහා ප්‍රතිෂ්ඨාවට අදාල නියමයන් හා කොන්දේසි වලට යටත් ව, මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද හා නියමයෙහි විස්තර කරන ලද යම් කෘෂිකාර්මික ඉඩමක් හෝ වතු ඉඩමක් හෝ ඉඩමේ යම් කොටසක් සතු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියම යක් මගින්, ඒ නියමය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි කොමිෂන් සභාව විසින් එම් නියමයෙහි විස්තර කරන ලද කෘෂිකාර්මික ඉඩමට හෝ වතු ඉඩමට හෝ ඉන් කොටසකට දරන ලද අයිතිවාසිකම, හිමිකම හා සම්බන්ධතාව ම, නියමයෙහි නිශ්චිතව සඳහන් කරන ලද රාජ්‍ය සංස්ථාව වෙත සතු කිරීමේ බලපෑම ඇති විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් යම් කෘෂිකාර්මික ඉඩමක් හෝ වතු ඉඩමක් හෝ එහි යම් කොටසක් යම් රාජ්‍ය සංස්ථාවක් වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ කෘෂිකාර්මික ඉඩමට හෝ වතු ඉඩමට හෝ එහි කොටසකට අදාළ වූ ද ඒ සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවතියා වූ ද ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ යම් ගිවිසුමක් හෝ එකඟ වීමක් යටතේ වූ කොමිෂන් සභාවේ සියලු අයිතිවාසි කම් සහ බැරකම් ඒ රාජ්‍ය සංස්ථාවේ අයිතිවාසිකම් සහ බැරකම් බවට පත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් යම් කෘෂිකාර්මික ඉඩමක් හෝ වතු ඉඩමක් හෝ ඉන් කොටසක් යම් රාජ්‍ය සංස්ථාවක් වෙත සතු කිරීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදාල යම් නියමයක් හෝ කොන්දේසියක් අනුව ක්‍රියාකර නොමැති අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඉඩමට අදාල (1) වන උපවගන්තිය යටතේ වූ නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි අතර, ඉන් අනතුරුව එම ඉඩම කොමිෂන් සභාව වෙත නැවත සතු වන්නේ ය.

ඇතැම් බැඳීම් ප්‍රතිෂ්ඨාපනය කිරීම.

27ආ. (1) කිසියම් කෘෂිකාර්මික ඉඩමක් 14 වන වගන්තිය යටතේ වූ ආඥාවක හේතුවෙන් යම් තැනැත්තකු වෙත පවරන ලද හෝ, 22 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ යම් තැනැත්තකු වෙත අන්සතු කරන ලද නැතහොත් සතු කරන ලද අවස්ථාවක හෝ 19 වන වගන්තිය යටතේ කරන ලද නිශ්චයක හේතුවෙන් යම් තැනැත්තකුට යම් කෘෂිකාර්මික ඉඩමක් තබා ගැනීමට ඉඩ දෙන ලද අවස්ථාවක, හෝ ඒ ඉඩම කොමිෂන් සභාව වෙත සතු වූ දිනයට පෙරාතුව වූ දිනයෙහි ඒ ඉඩම සම්බන්ධයෙන් පැවැති කිසියම් බැඳීමක් අවස්ථාවෝචිත පරිදි එම ආඥාවෙහි, අන්සතු කිරීමෙහි, සතු කිරීමෙහි හෝ තීරණයෙහි දිනයේ සිට ප්‍රතිෂ්ඨාපනය කිරීමේ බලපෑම අවස්ථාවෝචිත පරිදි එම ආඥාවෙහි, අන්සතු කිරීමෙහි, සතු කිරීමෙහි හෝ තීරණයෙහි තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බැඳීමක් සම්බන්ධයෙන්, කිසියම් සිවිල් අධිකරණයක යම් නඩුවක හෝ නඩු කටයුත්තක කාර්ය සඳහා කාලාපගමන කාලසීමාව ආගණනය කිරීමේ දී, ඒ බැඳීමට විෂය කාරණාව වූ කෘෂිකාර්මික ඉඩම, කොමිෂන් සභාව සතුව පැවැති කාලසීමාව අත් හරිනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) (අ) මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයේ දී, එම දිනයට කලින් කොමිෂන් සභාව සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් කිසිදු වන්දියක් ගෙවා නොමැති අවස්ථාවක ඒ කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය, (1) වන සහ (2) වන උපවගන්තිවල කුමක් සඳහන්ව ඇතද, එම කෘෂිකාර්මික ඉඩම කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ දිනයට

පෙරාතුව ම වූ දිනයෙහි එම ඉඩමේ අයිතිකරු වූ තැනැත්තාගේ තෝරා ගැනීම අනුව, පහත සඳහන් උපමාන දෙකින් එකක් අනුව ගණන් බැලිය යුතු ය:—

(i) කෘෂිකාර්මික ඉඩම කුඹුරක් නොවේ නම් ඒ ඉඩමේ 1971 මැයි මස 20 වන දිනට ඉහතින් වූ ගිණුම් වර්ෂයේ සහ පළමු වෙන් සඳහන් ගිණුම් වර්ෂයට ඉහතින් ම වූ ගිණුම් වර්ෂ හතරේ සාමාන්‍ය වාර්ෂික ලාභය මෙන් පසළොස් ගුණයක් නොඉක්මවන මුදලක් සහ ඒ ඉඩම කුඹුරක් නම් ඒ සාමාන්‍ය වාර්ෂික ලාභය මෙන් දස ගුණයක් නොඉක්මවන මුදල් ප්‍රමාණයක් ; හෝ

(ii) (අ) තේ, රබර් හෝ පොල් වගා කරන ලද කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ කෘෂිකාර්මික ඉඩම කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ තුන සඳහා ඒ කෘෂිකාර්මික ඉඩමෙන් අක්කරය කට ලැබුණු සාමාන්‍ය වාර්ෂික ඵලදාව පදනම් කරගෙන ගණන් බලන ලද මුදලක් ; එහෙත් ඒ කෘෂිකාර්මික ඉඩමේ අක්කරයක සාමාන්‍ය වාර්ෂික ඵලදාව මෙහි I වන තීරුවේ දක්වා ඇති ප්‍රමාණයට සමාන වන අවස්ථාවල දී ඒ කෘෂිකාර්මික ඉඩමේ එක් එක් අක්කරයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල, මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති මුදලට සමාන මුදලක් විය යුතු ය:—

| I වන තීරුව අක්කරයක සාමාන්‍ය වාර්ෂික ඵලදාව | II වන තීරුව අක්කරයක් සඳහා වන්දි මුදල් ප්‍රමාණය |
|---|---|
| **තේ :** | |
| රාත්තල් 1,500 ට වැඩි ... | රු. 2,500 |
| රාත්තල් 1,000 ට වැඩි එහෙත් රාත්තල් 1,500 ට නොවැඩි | රු. 2,000 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි | රු. 1,500 |
| රාත්තල් 750 ක් හා ඊට අඩු | රු. 1,000 |
| **රබර් :** | |
| රාත්තල් 1,000 ට වැඩි ... | රු. 2,500 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි | රු. 2,000 |
| රාත්තල් 500 ට වැඩි එහෙත් රාත්තල් 750 ට නොවැඩි | රු. 1,500 |
| රාත්තල් 500 ක් හා ඊට අඩු | රු. 1,000 |
| **පොල් :** | |
| ගෙඩි 3,000 ට වැඩි ... | රු. 2,500 |
| ගෙඩි 2,000 ට වැඩි එහෙත් ගෙඩි 3,000 ට නොවැඩි ... | රු. 2,000 |
| ගෙඩි 2,000 ක් හා ඊට අඩු ... | රු. 1,500 ; හෝ |

(ආ) කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, වී හෝ වෙන යම් කෘෂි කාර්මික නිෂ්පාදනයක් වගා කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වන විට, නිෂ්පාදනයේ පව තින ඒ කෘෂිකාර්මික ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 2,000 බැගින් ගණන් බලනු ලැබූ මුදලක්.

(ආ) යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වන්දිය වශයෙන් ගෙවිය යුතු (අ) ඡේදයේ (i) වන අනුඡේද යට අනුකූලව ගණන් බලන ලද යම් මුදල් ප්‍රමාණය කින්, එම කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන් 1971 මැයි මස 29 වන දිනට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ පහ තුළ ආණ්ඩුව විසින් හෝ යම් රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ නැවත වගා කිරීම, කර්මාන්තශාලා නවීකරණය, තේ පෙට්ටි සහ පොහොර සඳහා සහනාධාර වශයෙන් ගෙවන ලද සෑම මුදලක්ම අඩු කළ යුතු ය.

මේ උපවගන්තියේ "වාර්ෂික ලාභය" යන්න ගිණුම් වර්ෂයක් සඳහා යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව, ඒ ඉඩමේ ලාභ හා ආදායම වශ යෙන් එම වර්ෂය සඳහා තක්සේරුකරුවකු විසින් තක්සේරු කරන ලද පරිදි වූ නැත හොත් කලින් අයිතිකරු තක්සේරුකරුවකු සමග එකගවන ලද පරිදි වූ නැතහොත් එසේ තක්සේරු කර නොමැති හෝ එකඟ වී නො මැති අවස්ථාවක ඒ කලින් අයිතිකරු විසින් තක්සේරුකරුට ප්‍රකාශ කරන ලද පරිදි වූ ලාභ යෙහි හා ආදායමෙහි ; සහ

(ii) ඒ වර්ෂය සඳහා 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව කලින් අයිති කරුගේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ කාර්ය සඳහා එම පනතේ 10 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ඌ) ඡේදය හෝ (එ) ඡේදය හෝ 53 වන වගන්තිය හෝ 53අ වගන්තිය යටතේ අඩු කිරීමක් වශයෙන් ඉල්ලා සිටින ලද යම් මුදලක

මුළු එකතුව අදහස් වේ.

(ඇ) යම් කෘෂිකාර්මික ඉඩමක් සඳහා (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ගණන් බලන ලද වන්දි ලැබීමට යම් තැනැත්තකුට හිමිකම ඇත්තා වූ ද, ඒ කෘෂිකාර්මික ඉඩම කොමිෂන් සභාව වෙත සතු වූ දිනයට පෙරාතුව ම වූ වර්ෂ හත ඇතුළත ඒ ඉඩමෙහි, මෙහි I වන තීරුවේ දක්වෙන යම් කෘෂි කාර්මික බෝගයක් වගා කොට හෝ නැවත වගාකොට ඇත්තා වූ ද අවස්ථාවක, එසේ ගණන් බලන ලද වන්දි මුදලට අතිරේකව එසේ වගා කරන ලද හෝ

නැවත වගා කරන ලද එක් එක් කෘෂිකාර්මික ඉඩම් අක්කරයකට මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ දක්වෙන මුදලකට සමාන මුදලක් ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේ ය.

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| තේ ... ... | රු. 3,000 |
| රබර් ... ... | රු. 2,500 |
| පොල් ... ... | රු. 2,500 |
| වී ... ... | රු. 2,500 |
| කොකෝවා ... ... | රු. 2,000 |
| කුරුඳු ... ... | රු. 2,000 |
| වෙනත් යම් කෘෂිකාර්මික බෝගයක් ... | රු. 2,000 |

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල කුමක් සඳහන්ව ඇත ද, මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයෙන් පසුව කොමිෂන් සභාව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය ප්‍රධාන තක්සේරුකරුගේ මතය අනුව, 1977 මාර්තු මස 31 වන දින ඒ ඉඩම විවෘත වෙළෙඳ පොළෙහි විකුණනු ලැබුවේ නම්, එම දිනයෙහි ලබාගත හැකිව තිබුණු මිල 1977 මාර්තු මස 31 වන දිනයට පසුව ඒ ඉඩම සම්බන්ධයෙන් කරන ලද යම් වැඩිදියුණු කිරීම් වෙතොත්, ඒවායේ පිරිවැයට සමාන මුදලකින් වැඩි කරන ලද මුදලට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතුය.

(5) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුවද මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වන්දි ලැබීමට හිමිකම් ඇත්තා වූ යම් තැනැත්තකුට, කොමිෂන් සභාව වෙත සතු කරන ලද ඒ කෘෂිකාර්මික ඉඩම සඳහා වන්දියේ ප්‍රමාණය සහ එය ගෙවීමේ ආකාරය සහ ක්‍රමය සම්බන්ධයෙන් කොමිෂන් සභාව සහ ඒ තැනැත්තා අතර ඇති කර ගන්නා ලද යම් ගිවිසුමකට හෝ සාකච්ඡා මගින් බේරුම් කිරීමකට අනුකූලව, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ගෙවීමට කොමිෂන් සභාවට විධානය කරනු ලබන මුදල් ප්‍රමාණයක් ඒ ආකාරයට හෝ ක්‍රමයට කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබිය හැකිය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලපැවැත් විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඇතැම් බදු අත්හැරීම හෝ ආපසු ගෙවීම පිළිබඳ විධිවිධාන.

28අ. (1) කොමිෂන් සභාව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය ගණන් බලන ලද්දේ, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉඩමේ ලාභ හෝ අගය පදනම් කොට ගෙන ද එය ඉක්මවන, අවස්ථාවෝචිත පරිදි,

ලාභ හෝ අගය මත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ තෑගි බද්දක් හෝ 1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනත යටතේ යම් ප්‍රාග්ධන බද්දක් හෝ මුදල් බදු ආඥාපනත යටතේ යම් මුදල් බද්දක් හෝ ගෙවන ලෙස නිවේදනයක් කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ ආදායම් බද්ද, ධන බද්ද, තෑගි බද්ද, ප්‍රාග්ධන බද්ද හෝ මුදල් බද්ද සම්බන්ධයෙන් වූ තක්සේරුව ප්‍රතිශෝධනය කරවා ගැනීමට හා, එකී වැඩිපුර ගණන් බලන ලද ලාභ හෝ අගයට අදාළ කළ හැකි එකී බද්දේ කොටස අත්හරවා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

(2) කොමිෂන් සභාව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය ගණන් බලන ලද්දේ, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉඩමේ ලාභ හෝ අගය පදනම් කොට ගෙන ද එය ඉක්මවන, අවස්ථාවෝචිත පරිදි, ලාභ හෝ අගය මත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ තෑගි බද්දක් හෝ 1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනත යටතේ යම් ප්‍රාග්ධන බද්දක් හෝ මුදල් බදු ආඥාපනත යටතේ යම් මුදල් බද්දක් හෝ ගෙවා ඇති අවස්ථාවක ඒ බද්දේ, ප්‍රාග්ධන බද්දේ හෝ මුදල් බද්දේ එකී වැඩිපුර ගණන් බලන ලද ලාභ හෝ අගයට අදාළ කළ හැකි කොටස ආපසු ගෙවනු ලැබීමට, ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් ප්‍රතිශෝධනය කිරීමක් හෝ (2) වන උපවගන්තිය යටතේ ආපසු ගෙවීමක්, අවස්ථාවෝචිත පරිදි, එම තක්සේරුව කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා හෝ අදාළ බද්ද ගෙවන ලද්දේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ විසින්, 28 වන වගන්තිය යටතේ ඒ තැනැත්තාට වන්දි ගෙවනු ලැබූ දිනය හෝ මේ වගන්තිය පනවනු ලැබූ දිනය යන මෙයින් පසුව යෙදෙන දිනයේ සිට අවුරුද්දක් ඇතුළත. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ ඇන්වීමක් මගින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් අනුව පමණක් කරනු ලැබිය යුතු ය.

(4) ආදායම් බදු, ධන බදු, තෑගි බදු, ප්‍රාග්ධන බදු හෝ මුදල් බදු පිළිබඳ යම් තක්සේරුවක් ප්‍රතිශෝධනය කිරීම සඳහා හෝ එවැනි යම්

බද්දක් ආපසු ගෙවීම සඳහා මේ වගන්තිය යටතේ හිමිකම් පෑමක් කරනු ලැබූ අවස්ථාවක, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, ඒ තක්සේරුව ප්‍රතිශෝධනය කිරීම සහ ඒ ආපසු ගෙවීම කරනු ලැබිය හැකි ය. ".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

" එසේ වුවද එවැනි යම් හිමිකම් පාන්නකු විසින් වන්දියට ඇති තම හිමිකම නිසි අධිකරණයක අවසාන තීන්දු ප්‍රකාශයක් මගින් හෝ ප්‍රමාණවත් යයි කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන සාක්ෂි මගින් සනාථ කරනු ලබන අවස්ථාවක, වන්දි හිමි තැනැත්තන් පිළිබඳව ද ඔවුන් අතර වන්දිය කොටස් කිරීම පිළිබඳව ද කලින් අයිතිකරු ලියවිල්ලකින් එකඟත්වයට පත් නොවන්නේ වුවද එම තීන්දු ප්‍රකාශයේ නියමයන්ට හෝ ඉදිරිපත් කරන ලද සාක්ෂිවලට අනුකූලව වන්දිය කොටස් කර ගෙවීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සලස්වනු ලැබිය හැකිය. ".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ගෙවිය යුතු වන්දිය සහ පොලිය

35. මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය, එම ඉඩම කොමිෂන් සභාව වෙත සතු වීමෙන් පසු කොමිෂන් සභාව විසින් එහි සන්තකය භාර ගන්නා ලද දින සිට උපචිත වූ ලෙස සැලකිය යුතු අතර, එය උපචිත වූ දින සිට ගෙවීමේ දිනය දක්වා ඒ වන්දි මුදල් ප්‍රමාණය මත වර්ෂයකට සියයට දහයක් වූ පොලිය ගෙවිය යුතු ය. ".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (අ) ඡේදයේ " වර්ෂයකට සියයට හතක් " යන වචන වෙනුවට " ඒ ඉඩම සතු කරන ලද දිනයේ සිට ගෙවීමේ දිනය දක්වා වාර්ෂිකව සියයට දහයක් " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 42ඒ වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 42 ඒ වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

" (2අ) (අ) මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයේ දී මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව සතු වූ යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් කිසිදු වන්දියක් ගෙවා නොමැති අවස්ථාවක ඒ වතු ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ඒ වතු ඉඩම

කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ඒ වතු ඉඩමේ සන්තකය දැරූ තැනැත්තාගේ තෝරා ගැනීම අනුව පහත සඳහන් උපමාන දෙකින් එකක් අනුව ගණන් බැලිය යුතුය :—

(i) ඒ වතු ඉඩම කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුවම වූ ගිණුම් වර්ෂ පහ සඳහා ඒ වතු ඉඩමේ සාමාන්‍ය වාර්ෂික ලාභය මෙන් පසළොස් ගුණයකට සමාන මුදලක් ; හෝ

(ii) (අ) තේ, රබර් හෝ පොල් වගා කරන ලද වතු ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ වතු ඉඩම කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ තුන සඳහා ඒ වතු ඉඩමෙන් අක්කරයකට ලැබුණු සාමාන්‍ය වාර්ෂික පලදාව පදනම් කරගෙන ගණන් බලන ලද මුදලක් ; එහෙත් ඒ වතු ඉඩමේ අක්කරයක සාමාන්‍ය වාර්ෂික පලදාව මෙහි I වන තීරුවේ දක්වා ඇති ප්‍රමාණයට සමාන වන අවස්ථා වල දී ඒ වතු ඉඩමේ එක් එක් අක්කරයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල, මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති මුදලට සම න මුදලක් විය යුතු ය :—

| I වන තීරුව<br>අක්කරයක සාමාන්‍ය වාර්ෂික පලදාව | II වන තීරුව<br>අක්කරයක් සඳහා වන්දි මුදල් ප්‍රමාණය |
|---|---|
| **තේ** | |
| රාත්තල් 1,500 ට වැඩි ... | රු. 2,500 |
| රාත්තල් 1,000 ට වැඩි එහෙත් රාත්තල් 1,500 ට නොවැඩි ... | රු. 2,000 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි | රු. 1,500 |
| රාත්තල් 750 ක් හා ඊට අඩු... | රු. 1,000 |
| **රබර්** | |
| රාත්තල් 1,000 ට වැඩි ... | රු. 2,500 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි | රු. 2,000 |
| රාත්තල් 500 ට වැඩි එහෙත් රාත්තල් 750 ට නොවැඩි... | රු. 1,500 |
| රාත්තල් 500 හා ඊට අඩු ... | රු. 1,000 |
| **පොල්** | |
| ගෙඩි 3,000 ට වැඩි ... | රු. 2,500 |
| ගෙඩි 2,000 ට වැඩි එහෙත් 3,000 ට නොවැඩි ... | රු. 2,000 |
| ගෙඩි 2,000 හා ඊට අඩු ... | රු. 1,500 ; හෝ. |

(ආ) කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, වී හෝ වෙන යම් කෘෂිකාර්මික නිෂ්පාදනයක් වගා කරනු ලැබූ වතු ඉඩමක් සම්බන්ධයෙන් වන විට, නිෂ්පාදනයේ පවතින ඒ වතු ඉඩමේ එක් එක් අක්කරයක් සඳහා රු. 2,000 බැගින් ගණන් බලනු ලැබූ මුදලක්.

(ආ) යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් මෙම උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයට අනුකූලව ගණන් බලන ලද වන්දි ලැබීමට යම් තැනැත්තකුට හිමිකම ඇත්තා වූ ද ඒ වතු ඉඩම් කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුව ම වූ වර්ෂ හත ඇතුළත ඒ වතු ඉඩමෙහි, මෙහි I වන තීරුවේ දක්වෙන යම් කෘෂිකාර්මික බෝගයක් වගා කොට හෝ නැවත වගා කොට ඇත්තා වූ ද අවස්ථාවක, එසේ ගණන් බලන ලද වන්දි මුදලට අතිරේකව, එසේ වගා කරන ලද හෝ නැවත වගා කරන ලද එක් එක් වතු ඉඩම් අක්කරයක් සඳහා II වන තීරුවේ අනුරූප සටහනේ දක්වෙන මුදලට සමාන මුදලක්, ගෙවනු ලැබීමට, ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය:—

| I වන තීරුව | | | II වන තීරුව |
|---|---|---|---|
| තේ | ... | ... | රු. 3,000 |
| රබර් | ... | ... | රු. 2,500 |
| පොල් | ... | ... | රු. 2,500 |
| වී | ... | ... | රු. 2,000 |
| කොකෝවා | ... | ... | රු. 2,000 |
| කුරුඳු | ... | ... | රු. 2,000 |

මේ උපවගන්තියේ "වාර්ෂික ලාභය" යන්න හිණුම් වර්ෂයක් සඳහා යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් යෙදෙන විට එයින්—

(i) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව, ඒ වතු ඉඩමේ ලාභ හා ආදායම වශයෙන්, එම වර්ෂය සඳහා තක්සේරුකරුවකු විසින් තක්සේරු කරන ලද පරිදි වූ, නැතහොත් ඒ වතු ඉඩම කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඒ වතු ඉඩමේ අයිතිකරුව සිටි (මේ අර්ථකථනයෙහි "කලින් අයිතිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තා තක්සේරුකරුවකු සමග එකඟ වන ලද පරිදි වූ නැතහොත් එසේ තක්සේරු කර හෝ එකඟවී නොමැති අවස්ථාවක, ඒ කලින් අයිතිකරු විසින් එම වර්ෂය සඳහා තක්සේරුකරුට ප්‍රකාශ කරන ලද පරිදි වූ ලාභ හා ආදායමෙහි; සහ

(ii) එම වර්ෂය සඳහා 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව එම වතු ඉඩමෙන් වූ කලින් අයිතිකරුගේ ලාභ හා ආදායම නිශ්චය කිරීමේ කාර්ය සඳහා, ඒ පනතේ—

(අ) 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඌ) ඡේදය හෝ (එ) ඡේදය; හෝ

(ආ) 53 වන වගන්තිය; හෝ

(ඇ) 53අ වගන්තිය

යටතේ අඩු කරන ලද යම් මුදලක මුළු එකතුව අදහස් වේ.

(ඈ) යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල වශයෙන් (අ) ඡේදයේ (i) අනුඡේදයට අනුකූලව ආගණනය කරන ලද කවර හෝ මුදල් ප්‍රමාණයකින්, ඒ වතු ඉඩම රජය සතු වූ දිනයට පෙරාතුවම වූ ගිණුම් වර්ෂ පහ අතුරින් යම් ගිණුම් වර්ෂයක් තුළ දී, නැවත වගා කිරීම, කර්මාන්ත ශාලා නවීකරණය කිරීම, තේ පෙට්ටි සහ පොහොර සඳහා ආණ්ඩුව විසින් හෝ යම් රාජ්‍ය සංස්ථාවක් විසින්, සහනාධාර වශයෙන් ගෙවන ලද සෑම මුදලක්ම අඩු කරනු ලැබිය යුතු ය.

යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල වශයෙන් (අ) ඡේදයේ (i) අනුඡේදයට අනුකූලව ආගණනය කරන ලද කිසිදු මුදල් ප්‍රමාණයක් ඒ වතු ඉඩමේ එක් එක් අක්කරය සඳහා, රුපියල් දෙදහස් පන්සියය නොඉක්මවිය යුතු ය.

(2ආ) මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයෙහි, මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව සතු වූ යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් කිසිදු වන්දියක් ගෙවා නොමැති හා සතුවූ දිනයේ දී ඒ වතු ඉඩම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් භාරගත් ශුද්ධ ජංගම වත්කම් පැවතියා වූ අවස්ථාවක, (2අ) උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දිය ඒ ශුද්ධ ජංගම වත්කම්වල පොතේ වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයකින් වැඩි කළයුතු වන්නේ ය.

මේ වගන්තියේ "ශුද්ධ ජංගම වත්කම්" යන්නෙන් වෙළෙඳ තොග, අලෙවි නොකරන ලද නිෂ්පාදන, මුදල්, ස්ථාවර තැන්පතු, අයවිය යුතු ණය සහ ලැබිය යුතු වෙනත් දේ අදහස් වේ.

(2ඇ) මේ උපවගන්තිය පනවන ලද දිනය වන විට ඒ වතු ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් යම් එකඟවීමකට ඇතුළත් නොවූ හෝ සාකච්ඡා මගින් සම්මුතියකට නොඑළැඹුණු එක්සත් රාජධානියෙහි සංස්ථාගත කරන ලද යම් සමාගමකට ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය ගණන්

බැලීමේදී (2අ) හා (2ආ) උපවගන්තිවල කිසිවක් අදාළ නොවිය යුතු අතර, (2) වන උපවගන්තියේ නියමයන් අනුව ඒ වතු ඉඩම සම්බන්ධයෙන් වන්දිය ගෙවිය යුතු ය.

(2ඇ) (1) (2) වන උපවගන්තියේ හෝ (2අ) වන උපවගන්තියේ හෝ (2ආ) වන උපවගන්තියේ විධිවිධාන අනුව ගණන් බලන ලද වන්දි වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් යම් පොදු සමාගමකට ලැබුන අවස්ථාවක, සමාගම් ආඥාපනතේ හෝ වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලබන බැරකම් පියවීමෙන් පසු, ඒ වන්දි මුදල් ලැබුණු දින සිට මාස හයක් ඇතුළත දී නැතහොත් ඒ වන්දි මුදල් වාරික වලින් ලැබුණු අවස්ථාවක, ඒ එක් එක් වාරිකය ලැබීමෙන් පසු මාස හයක් ඇතුළතදී ඒ සමාගමේ කොටස්කරුවන් අතර ඒ වන්දි මුදල් බෙදාදීම ඒ සමාගමේ කාර්යය විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් සමාගමක කොටස් ප්‍රාග්ධනය විවිධ කොටස් පංතිවලට බෙදා ඇති අවස්ථාවක, වන්දිය බෙදාදීම ඒ එක් එක් කොටස් පංතියට අයත් අයිතිවාසිකම්වලට අනුකූල විය යුතු ය.

(2ඉ) වන්දි වශයෙන් පොදු සමාගමකට ලැබුණ යම් මුදල් ප්‍රමාණයක් (2ඇ) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාගම විසින් බෙද දෙනු ලැබ, ඒ බෙදදීමේ ප්‍රතිඵලය වශයෙන් ස්වකීය ව්‍යාපාරය කරගෙන යාමට නොහැකි බවට සම්මත කරනු ලබන අවස්ථාවකදී, ස්වකීය නාමය සමාගම් ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් කපා හැරීම පිණිස ඒ සමාගම විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය. එවිට—

(අ) ඒ සමාගමේ සියලු බැරකම් ගෙවා ඇති බවට ;

(ආ) සමාගම විසින් ලබාගෙන ඇති වන්දි මුදල් (2ඇ) වන උපවගන්තියට අනුකූලව බෙදාදී ඇති බවට ; සහ

(ඇ) සමාගමට ව්‍යාපාරය කරගෙන යාමට නොහැකි බවට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වීමෙන් පසු, සමාගම් ගණන් බේරා වසා දැමීම හෝ විසුරුවා හැරීම හෝ සම්බන්ධයෙන් සමාගම් ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, එම සමාගමේ නම එම සමාගම් ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් කපාහැරිය යුතු ය ; ".

(ආ) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (4) මේ පනතේ මේ කොටස යටතේ වන්දියෙන් කළ හැකි සම අඩු කිරීම් අඩුකොට ගෙවිය යුතු වන්දියට, වන්දි ගෙවිය යුතු ඒ වතු ඉඩමේ සන්තකය කොමිෂන්

සභාව විසින් සතුකර ගන්නා ලද දිනයේ සිට ගෙවීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහයක් වූ පොලිය අයත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ "තැනැත්තා" යන යෙදුමේ අර්ථකථනය, එහි (ආ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇආ) පුද්ගලික භාරයක්; හෝ".

2 (අ) වන, 12 වන සහ 15 වන වගන්ති අතීතයට බලපාන බව.

16. මේ පනතේ 2(අ) වන, 12 වන සහ 15 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධන, සියළු කාර්ය සඳහා, ප්‍රධාන ප්‍රඥප්තිය ආරම්භ වූ දිනයේ සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

## II වන කොටස

### ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කරන ලද ඇතැම් ආඥා සහ නිශ්චය කිරීම් සම්බන්ධයෙන් වන විශේෂ විධිවිධාන

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් කරන ලද ඇතැම් ආඥා සම්බන්ධයෙන් වන විශේෂ විධිවිධාන.

17. (1) මේ පනත ආරම්භ වීමට පෙර, පැවරුම්කරුට සහ පැවරුම්ලාභියාට හෝ කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී, යම් කෘෂිකාර්මික ඉඩමක් පවරාදීම ශූන්‍ය හා බල රහිත බව ප්‍රකාශ කර මින්, කොමිෂන් සභාව විසින්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ, මේ පනත ආරම්භ වන දිනයට පෙර—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් යම් වන්දියක් ගෙවා තිබුණු; හෝ

(ආ) ඒ ඉඩම එම පනතේ 22 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පවරා දී තිබුණු

අවස්ථාවක යට කී පරිදි කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නො දීමේ හේතුව මත ම පමණක් ඒ ආඥාව අවලංගුව නොපැවති බව හෝ අවලංගුව නො පවත්නා බව සැලකිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වීමට පෙර, පැවරුම්කරුට හෝ පැවරුම් ලාභියාට හෝ කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී යම් කෘෂිකාර් මික ඉඩමක් පවරාදීම ශූන්‍ය සහ බලරහිත බව ප්‍රකාශ කරමින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ආඥාවක් කරනු ලැබ, මේ පනත ආරම්භ වන දිනයට පෙර—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් යම් වන්දියක් ගෙවා තිබුණු; හෝ

(ආ) ඒ ඉඩම එම පනතේ 22 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පවරා දී තිබුණු

අවස්ථාවක යටකී පරිදි කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නො දීමේ හේතුව මත ම පමණක් ඒ ආඥාව අවලංගුව නොපැවති බව හෝ අවලංගුව නොපවත්නා බව සැලකිය යුතු ය.

(3) මේ පනත ආරම්භවීමේ දිනයට පෙර, පැවරුම්කරුට හෝ පැවරුම්ලාභියාට හෝ කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී, යම් කෘෂිකාර්මික ඉඩමක් පවරා දීම ශූන්‍ය සහ බල රහිත බව ප්‍රකාශ කරමින්, කොමිෂන් සභාව විසින්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක සහ මේ පනත ආරම්භ වන දිනයෙහි—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වන වගන්තිය යටතේ එම ඉඩම සම්බන්ධයෙන් වන්දියක් ගෙවා නොතිබුණි නම්; හෝ

(ආ) ඒ පනතේ 22 වන වගන්තිය යටතේ එම ඉඩම යම් තැනැත්තකු වෙත පවරා දී නොතිබුණි නම්

ඒ ආඥාව ශූන්‍ය සහ බල රහිතව පැවති බවත් ශූන්‍ය සහ බල රහිත වන බවත් සැලකිය යුතු ය.

(4) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර, පැවරුම්කරුට සහ පැවරුම්ලාභියාට කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී, යම් කෘෂිකාර්මික ඉඩමක් පවරා දීම ශූන්‍ය සහ බල රහිත බව ප්‍රකාශ කරමින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක සහ මේ පනත ආරම්භ වන දිනයෙහි—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වන වගන්තිය යටතේ එම ඉඩම සම්බන්ධයෙන් වන්දියක් ගෙවා නොතිබුණි නම්; හෝ

(ආ) ඒ පනතේ 22 වන වගන්තිය යටතේ ඒ ඉඩම යම් තැනැත්තකුට පවරා දී නොතිබුණි නම්

ඒ ආඥාව ශූන්‍ය සහ බල රහිතව පැවති බවත්, ශූන්‍ය සහ බල රහිත වන බවත් සැලකිය යුතු ය.

(5) යම් කෘෂිකාර්මික ඉඩමක් පවරාදීම ශූන්‍ය සහ බලරහිත බව ප්‍රකාශ කරමින්, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව හෝ අමාත්‍යවරයා විසින් කරන ලද ආඥාවක් (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් මේ කොටස යටතේ ශූන්‍ය සහ බලරහිත යයි සලකනු ලබන අවස්ථාවක, මේ පනත ආරම්භ වී මාස තුනක් ඇතුළත දී, පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා විසින් ඒ පවරාදීම කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද වාර්තාවක් අනුව, කරුණු දක්වා සිටීමට අවස්ථාවක් පැවරුම්කරුට හා පැවරුම්ලාභියාට සලසා දීමෙන් පසු, ඒ වාර්තාවෙහි සඳහන් පවරාදීම ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ පරමාර්ථ ව්‍යර්ථ කෙරෙන ස්වභාවයෙන් යුක්ත බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ අත්සන යටතේ වූ ආඥාවක් මගින් ඒ පවරාදීම ශූන්‍ය හා බලරහිත බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. එවැනි සෑම ආඥාවක් ම එම ආඥාව අදාළ වන පැවරුම්කරු වෙත සහ පැවරුම්ලාභියා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලබන සෑම ආඥාවකටම ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (3) වන, (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(8) (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමක්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒ සඳහා දඬුවම් පැමිණ විය යුතු ය.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ කරන ලද ඇතැම් ආඥා සම්බන්ධයෙන් වන විශේෂ විධිවිධාන.

18. (1) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හිමිකම ඒ පනත ආරම්භ වූ දිනයෙහි ලබා සිටිය ද ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත දී ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ යම් තැනැත්තකු—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ආරම්භ වූ (මේ උපවගන්තියෙහි "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයට ඉහතින්ම වූ දිනයෙහි යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරුව සිටියේ නම්, මේ පනත ආරම්භ වූ දිනයේ දී ඒ තැනැත්තා ඒ ඉඩමෙහි ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරු නොවුව ද, තව ද,

(ආ) ඉහත සඳහන් 14 වන වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද මේ පනත ආරම්භ වූ දිනයේ දී ඒ තැනැත්තා ඒ ඉඩමේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුව සිටියාක් මෙන්, ඒ ඉඩම සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ විකිණීමෙන්, තෑගි දීමෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ඒ තැනැත්තාගේ යම් දරුවකුට, එනම්, අදාළ දිනයේ දී අවුරුදු දහ අටක් ව හෝ ඊට වැඩි වයසක සිටි දරුවකුට නැතහොත් ඒ තැනැත්තාගේ දෙමාපියන්ගෙන් කෙනකුට, පැවරීම සඳහා ඒ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක්, මේ පනත ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත දී ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) ඉහත සඳහන් පරිදි ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත ලැබුණු විටක, මේ පනත ආරම්භ වන දිනයේ දී,—

(අ) ඒ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් ඉඩම සම්බන්ධයෙන් කිසිදු චන්දියක් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වන වගන්තිය යටතේ ගෙවා නොතිබුණහොත් ; සහ

(ආ) ඒ පනතේ 22 වන වගන්තිය යටතේ ඒ ඉඩම යම් තැනැත්තකුට පවරා දී නොතිබුණහොත්

පමණක්, ඒ පැවරීම සඳහා අනුමතය දෙමින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කොමිෂන් සභාව විසින් කළ හැකි ය.

(3) යම් කෘෂිකාර්මික ඉඩමක් පැවරීම සඳහා අනුමතය දීම ප්‍රතික්ෂේප කරමින්, කොමිෂන් සභාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් මේ පනත ආරම්භවීමේ දිනයට පෙර

කර තිබුණාවූ ද ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව තුළ දී ඒ ආඥාවට විරුද්ධව ආයාචනයක් අමාත්‍යවරයා වෙත ඉදිරි පත් කිරීමට, ඒ පැමිණිම කිරීමට අනුමතය ඉල්ලා සිටි තැනැත්තා අපොහොසත් වී තිබුණා වූ ද අවස්ථාවක දී, ඒ වගන්තියේ කුමක් සඳහන් ව ඇත ද මේ පනත ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත දී, ඒ තැනැත්තා විසින් ඒ ආඥාවට විරුද්ධව අමාත්‍යවරයා වෙත අයාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(4) කොමිෂන් සභාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවට විරුද්ධව ආයාචනයක්, මේ පනත ආරම්භවීමේ දිනයට පෙර, යම් තැනැත්තකු විසින් ඒ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර තිබුණා වූ ද අමාත්‍යවරයා විසින් ඒ ආයාචනය ප්‍රතික්ෂේප කර ඇත්තා වූ ද අවස්ථාවක, ඉහත සඳහන් 14 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇතද, මේ පනත ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත දී ඒ ආඥාවට විරුද්ධව තවදුරටත් වූ ආයාචන යක් ඒ තැනැත්තා විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ ඉදිරිපත් කරන ලද ආයාචනයක් අමාත්‍යවරයා වෙත ලැබුණු අවස්ථාවක දී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ආරම්භ වන දිනයේ දී—

(අ) ඒ ආයාචනයෙහි සඳහන් ඉඩම සම්බන්ධයෙන් වත්දියක්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වන වගන්තිය යටතේ ගෙවා නොතිබුණේ නම්; සහ

(ආ) එම පනතේ 22 වන වගන්තිය යටතේ එම ඉඩම යම් තැනැත්තකුට පවරා දී නොතිබුණේ නම්,

පමණක් ඒ ආයාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් ආඥාවකට විරුද්ධව ද ඒ ආඥාව සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සියලුම අවස්ථානුගත කරුණු අනුව සාධාරණ හා යුක්ති සහගත වන බව අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, ඒ ආඥාව අමාත්‍යවරයා විසින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම කළ හැකි ය.

(6) පහත දැක්වෙන යම් අවස්ථාවක දී, එනම්,—

(අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර කොමිෂන් සභාව විසින් එකී 14 වන වගන්තිය යටතේ ආඥාවක් කර ඇත්තා වූ; හෝ

(ආ) එකී පනතේ 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද ආඥාවක් මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් වෙනස් කර, සුළු වශයෙන් වෙනස් කර හෝ සංශෝධනය කර ඇත්තා වූ

අවස්ථාවක දී, ඒ ආඥාවේ බලපෑම, නැතහොත්, වෙනස් කරන ලද, සුළු වශයෙන් වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද ඒ ආඥාවේ බලපෑම වනුයේ යම් කෘෂිකාර්මික ඉඩමක් (මේ උපවගන්ති

යේ මින්මතු "පැවරුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු විසින් ඔහුගේ (මේ උපවගන්තියේ මින්මතු "පැවරුම්ලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) දරුවකුට හෝ දෙමාපියන්ගෙන් කෙනකුට පැවරීම සඳහා අනුමතය දීම වේ නම් සහ, ඒ ආඥාව කරන ලද දිනයේ දී නැතහොත් ඒ ආඥාව එසේ වෙනස් කරන ලද, සුළු වශයෙන් වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද දිනයේ දී ඒ ඉඩම කොමිෂන් සභාව වෙත සතුව තිබුණේ නම්, කොමිෂන් සභාව විසින් නොපමාව ම ඒ ඉඩම ඒ පැවරුම්ලාභියා වෙත පැවරිය යුතු ය.

(7) පහත සඳහන් අවස්ථාවලට, එනම්,—

(අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර, කොමිෂන් සභාව විසින් එකී 14 වන වගන්තිය යටතේ කරන ලද ; හෝ

(ආ) එකී 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලදුව, මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් වෙනස් කරන ලද හෝ සුළු වශයෙන් වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද

සෑම ආඥාවකටම ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ කරන ලද ඇතැම් නිශ්චය කිරීම් සම්බන්ධයෙන් වන විශේෂ විධිවිධාන.

19. (1) මේ පනත ආරම්භ වීමට පෙර, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ කෘෂිකාර්මික ඉඩමකින් යම් තැනැත්තකු වෙත තබා ගැනීමට ඉඩ දෙනු ලබන කොටස හෝ කොටස් හෝ නිශ්චිතව සඳහන් කරමින් කොමිෂන් සභාව විසින් කරන ලද නිශ්චය කිරීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එකී ඉහත සඳහන් 19 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද මේ පනත ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත දී ඒ නිශ්චය කිරීමට විරුද්ධව ආයාචනයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයක දී,—

(අ) ආයාචක සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීම මගින් ඔහුට තබා ගැනීමට ඉඩ දෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටසෙහි හෝ කොටස්වල ප්‍රමාණය සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව වෙනස්කමක් කර ඇති බවට ; හෝ

(ආ) ආයාචක විසින් එම පනතේ 18 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනය මගින් ඔහු විසින් දක්වන ලද කැමැත්ත, ඒ නිශ්චය කිරීමේ දී කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගෙන නොමැති බවට

කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත් සහ, මේ පනත ආරම්භ වන දිනය වන විට,—

(අ) ආයාචක විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනය මගින් තමාට අයත් යයි නිශ්චිතව සඳහන් කරන ලද කෘෂිකාර්මික ඉඩමෙන් පහත සඳහන් කොටස, එනම්, ඒ පනතේ 19 වන වගන්තිය යටතේ ඔහු සම්බන්ධයෙන් කරන ලද නිශ්චය කිරීමෙහි නිශ්චිතව සඳහන් ඉඩම් කොටස හැර, ඒ සම්පූර්ණ ඉඩම සම්බන්ධයෙන් වන්දි මුදලක් ඒ පනතේ 28 වන වගන්තිය යටතේ ගෙවා නොතිබුණ හොත් ;

(ආ) (ඒ 19 වන වගන්තිය යටතේ ඔහු සම්බන්ධයෙන් කරන ලද නිශ්චය කිරීමෙහි නිශ්චිතව සඳහන් ඉඩම් කොටස හැර) ඒ මුළු ඉඩම ඒ පනතේ 22 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පවරා දී නොතිබුණහොත්

පමණක්, ඉහත කී 19 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, 19 වන වගන්තිය යටතේ, ආයාචක සම්බන්ධයෙන් කර තිබුණු නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් අවලංගු කර ඔහු සම්බන්ධයෙන් අලුත් නිශ්චය කිරීමක් ඒ වගන්තිය යටතේ කළ හැකි ය.

(3) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමක් කොමිෂන් සභාව විසින් (2) වන උප වගන්තිය යටතේ අවලංගු කරනු ලබන අවස්ථාවක දී ඒ අවලංගු කිරීම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, ඒ අවලංගු කිරීම එසේ පළ කරන ලද දිනයේ සිට බලපැවැත්විය යුතු ය ; තව ද එසේ පළ කරන ලද ඒ අවලංගු කිරීමේ බලපෑම වනුයේ ඒ නිශ්චය කිරීමෙහි නිශ්චිතව සඳහන් කෘෂිකාර්මික ඉඩමේ අයිතිවාසිකම, හිමිකම සහ සම්බන්ධතාව ඒ පළ කිරීමේ දින සිට කොමිෂන් සභාව වෙත යළි සතු වීම ය.

(4) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද නිශ්චය කිරීමක් අවලංගු කර අලුත් නිශ්චය කිරීමක් කොමිෂන් සභාව විසින් එම වගන්තිය යටතේ කරනු ලබන අවස්ථාවක දී, එම පනතේ 18 වන වගන්තිය යටතේ ඉල්ලුම්කරු විසින් කරන ලද ප්‍රකාශනයෙහි ඔහුට අයිති යැයි ඔහු විසින් සඳහන් කරන ලද කෘෂිකාර්මික ඉඩමේ කවර කොටස හෝ කොටස් ඔහුට තබා ගැනීමට ඉඩ දෙනු ලැබේ ද යන්න ඒ නිශ්චය කිරීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, එසේ නිශ්චිත කොටස හෝ කොටස්, මේ පනත ආරම්භ වන දිනයේ දී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුට පවරා දී නොතිබුණු ඒ කෘෂිකාර්මික ඉඩමේ යම් කොටසින් වූ කොටසක් හෝ කොටස් විය යුතු ය ; නැතහොත් එකී පනතේ 28 වන වගන්තිය යටතේ වන්දි මුදල් ගෙවනු නොලැබූ කොටසක් හෝ කොටස් විය යුතුය. නිශ්චය කිරීම කරනු ලබන දිනයේ දී ඒ තැනැත්තා ඒ ඉඩමේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරු නොවූව ද ඉහත සඳහන් ආකාරයට නිශ්චය කිරීමක් කරනු ලැබිය හැකි ය ; තවද ඒ සෑම නිශ්චය

කිරීමකට ම ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19(1) (ආ), 19(2) වන, 20 වන සහ 21 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(5) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය හෝ 19 වන වගන්තිය හෝ 22 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක හෝ නිශ්චය කිරීමක ප්‍රතිඵලය වශයෙන් ප්‍රමාණයෙන් අක්කර විසිපහකට වැඩි වූ යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු බවට පත් වන යම් තැනැත්තකු විසින් 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනතේ හෝ 1972 අංක 2 දරන වතු (පැවරීම් පාලනය කිරීමේ හා අත්කර ගැනීමේ) පනතේ විධිවිධාන යටතේ හැර අන්‍යාකාරයකින් ඒ ඉඩම කැබලි විය හැකි ආකාරයෙන් ඒ ඉඩම විකිණීම නීත්‍යානුකූල නොවන්නේ ය.

ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 වන වගන්තිය යටතේ වූ ඇතැම් පවරා දීම්වලට අදාළ විශේෂ විධිවිධාන.

20. (මේ පනත මගින් ඉවත් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් යම් කෘෂිකාර්මික ඉඩමක් යම් තැනැත්තකු වෙත පවරා දීමට, මේ පනත ආරම්භවීමේ දිනයට පෙර, එම ඡේදය යටතේ පියවර ගෙන ඇති අවස්ථාවකදී, මේ පනත මගින් එම ඡේදය ඉවත් කරනු ලැබුව ද, ඒ ඡේදය ක්‍රියාත්මක ව බලපැවතියාක් මෙන් ඒ තැනැත්තාට ඒ ඉඩම විකිණීමෙන් පවරා දීමක් කරනු ලැබිය හැකි ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සතු වූ ඇතැම් ඉඩම් පිළිබඳ විධිවිධාන.

21. (1) 1971 මැයි මස 29 වන දින හෝ ඉන් පසුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඉඩම් අත්කර ගනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වන විට ඒ ඉඩම් සම්බන්ධයෙන් වන්දි ගෙවා නොමැති අවස්ථාවක, මේ පනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ කුමක් සඳහන් ව ඇත ද, ඒ ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාව සතු වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එම පනතේ 14 වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ යටතේ ව්‍යවස්ථාපිත බදුගැනුම්කරුවකුගේ අයිතිවාසිකම්වලට ඒ ඉඩම්වල අයිතිකරුවන් හිමිකම් ලැබිය යුතු ය ; තව ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට මාස තුනක් ඇතුළත ඒ අයිතිකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව සතු වූ යම් ඉඩමක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත බදුගැනුම්කරුවකුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩමකින් ඔහුට තබා ගැනීමට ඉඩ දෙනු ලබන කොටස හෝ කොටස් නිශ්චිතව සඳහන් කරමින්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය කිරීමක් කොමිෂන් සභාවට කළ නොහැකි වන අවස්ථාවක, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ යම් තැනැත්තකුට අයිතිව තිබිය හැකි උපරිම කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෝ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ ව්‍යවස්ථාපිත බදුගැනුම්කරුගෙන් අත්කර ගන්නා ලද ඉඩම් ප්‍රමාණය හෝ යන දෙකින් අඩු ප්‍රමාණය කොමිෂන් සභාව විසින් ඒ ව්‍යවස්ථාපිත බදුගැනුම්කරු වෙත පවරනු ලැබිය යුතු ය.

(3) යම් කෘෂිකාර්මික ඉඩමක් පවරා දීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අනුමතය දීම කොමිෂන් සභාවට කළ නොහැකි වන අවස්ථාවක, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ව්‍යවස්ථාපිත බදුගැනුම්කරුගෙන් අත්කර ගන්නා ලද තාක් ප්‍රමාණය කොමිෂන් සභාව විසින් ඒ ව්‍යවස්ථාපිත බදුගැනුම්කරුගේ යම් දරුවකු නැතහොත් දෙමව්පියන්ගෙන් කෙනකු වෙත පවරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත සතු වූ ලෙස සලකනු ලබන සහ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලද ඉඩම් සඳහා වන්දි ගෙවා නොමැති අවස්ථාවක, සහ (2) වන උපවගන්තිය යටතේ නිශ්චය කිරීමක් කරනු නොලැබ ඇති අවස්ථාවක හෝ, (3) වන උපවගන්තිය යටතේ අනුමතය දීමක් කර නොමැති අවස්ථාවක, ඒ ඉඩම් සඳහා මේ පනත යටතේ වන්දි ලබා ගැනීමේ හිමිකම ව්‍යවස්ථාපිත බදුගැනුම්කරුට තිබිය යුතු ය.

22. මේ පනතේ මේ කොටසෙහි— අර්ථ නිරූපණය.

"කොමිෂන් සභාව" යන්නෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මගින් පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ ; සහ

"ඉඩම් ප්‍රතිසංස්කරණ පනත" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ.